රඹෑව ප්‍රාදේශීය සභාව
අනුරාධපුර දිස්ත්‍රික්කය
--------------------------------

01. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 අගෝස්තු 25 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 14 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 අහිතකර මතය
-----------------

මෙම වාර්තාවේ අහිතකර මතය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට රඹෑව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 අහිතකර මතය සඳහා පදනම
--------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.2,436,000 ක් වූ හිඟ මුද්දර ගාස්තු ආදායම මූල්‍ය ප්‍රකාශනවල රු.2,486,300 ක් ලෙස දක්වා තිබීම නිසා රු.50,300 ක් වැඩියෙන් දක්වා තිබුණි. | අදාළ වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිවැරදි හිඟ හිටි මුද්දර බදු වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව හඳුනාගෙන ඇති ලේඛන ගත නොවූ කාර්යාල උපකරණ වත්කම් අයිතම 242 ක වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | සභාවට අයත් සියළුම වත්කම්වල වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂය සඳහා කාර්යාලය සතු උපකරණ, වාහන, ගොඩනැගිලි හා ඉඩම්වල ශේෂය තක්සේරු කිරීමේදී භාණ්ඩ සමීක්ෂණ වාර්තාව උපයෝගී කර ගනිමින් ගිණුම්ගත කර ඇති බව දන්වමි. |

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (iii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.12,986,022 ක්වූ ඉඩම් හා ගොඩනැගිලි මූල්‍ය ප්‍රකාශනවල රු.11,653,653 ක් ලෙස දක්වා තිබීම නිසා රු.1,332,369 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ඉඩම් හා ගොඩනැගිලිවල නිවැරදි වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ආ) නොසැසඳුනු ගිණුම්

---------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පොදු ලෙජරයේ ගිණුම් ශේෂ 10 ක රු.9,340,809 ක වටිනාකම ශේෂ පිරික්සුමේ රු.10,581,613 ක් ලෙස දක්වා තිබුණු බැවින් රු.1,701,042 ක එකතු වෙනසක් පැවතුණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂ පිරික්සුමේ ගිණුම් 05 ක එකතු වටිනාකම රු.176,136,118 ක් මූල්‍ය ප්‍රකාශනවල රු.176,217,615 ක් ලෙස දක්වා තිබුණු බැවින් රු.1,606,481 ක එකතු වෙනසක් පැවතුණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් ශේෂ 06 ක එකතු වටිනාකම වූ රු.274,591,526 ක් ගිණුම්කරණ සටහන් හා උපලේඛන අනුව රු.272,668,294 ක් වූ බැවින් රු.3,459,446 ක එකතු වෙනසක් පැවතුණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. |

(ඇ) අවිනිශ්චිත ගිණුම

--------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වර්ෂ ගණනාවක සිට ගිණුම් අතර හුවමාරු ලෙස පැවත එමින් තිබුණු රු.115,378 ක අවිනිශ්චිත ගිණුම් ශේෂය පිළිබඳව සොයා බලා අවශ්‍ය ගැලපුම් කර නිරවුල් කර ගැනීමට කටයුතු නොකර ලංකා බැංකුවේ ජංගම ගිණුමක අයිරා ශේෂයක් ලෙස සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ඒ පිළිබඳව සොයාබලා ගිණුම්වල අවශ්‍ය ගැලපීම් කර අවිනිශ්චිත ගිණුම නිරවුල් කල යුතුවේ. | පූර්ව වර්ෂ ගණනාවක සිට පැවත එන රු.115,378 ක අවිනිශ්චිත ශේෂය 2020 ජූලි මස මහා සභාව වෙත යොමු කර එහි යෝජනා ස්ථිරත්වය සමගින් මෙම ශේෂ මුදල නිරවුල් කිරීමට පියවර ගෙන ඇති බව දන්වමි. |

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(i) ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වර්ෂ ගණනාවක සිට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ලැබිය යුතු ගිණුම් විෂයයන් 04 කට අදාල රු.3,655,064 ක් අයකර ගෙන නොතිබුණි. | ලැබිය යුතු ගිණුම් ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | වසර ගණනාවක සිට පැවත එන බැවින් මහා සභාව වෙත යොමුකර අවශ්‍ය කටයුතු සිදුකරන බව දැනුම් දෙමි. |

(ii) ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ඉකුත් වර්ෂ කිහිපයක සිට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ගෙවිය යුතු ගිණුම් විෂයයන් 09 කට අදාල රු.1,534,393 ක් නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | වසර ගණනාවක සිට පැවත එන බැවින් මහා සභාව වෙත යොමුකර අවශ්‍ය කටයුතු සිදුකරන බව දැනුම් දෙමි. |

(ඉ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වටිනාකම රු.68,842,896 ක් වූ ගිණුම් විෂයයන් 12 කට අදාළව පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | පිළිගනිමි. |

1.4 අනුකූල නොවීම්

---------------------

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

-------------------------------------------------------------------------

| | නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය රීති 33 | වරිපනම් ගෙවීම පැහැරහරින පුද්ගලයන් පිළිබඳව ලැයිස්තුවක් සහ දේපල තහනම් කිරීමේ ලැයිස්තු පිළියෙල කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | වරිපනම් ගෙවීම් පිළිබඳව රතු නිවේදන නිකුත් කිරීම හා දේපල තහනම් කිරීමේ වරෙන්තුව 2020 තෙවන කාර්තුවේ සිට ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ මුදල් රෙගුලාසි 1645 | සභාවේ වාහනවලට අදාල ධාවන සටහන් සහ මාසික සාරාංශ ඉදිරිපත් කර නොතිබු අතර ලොග් පොත් සහ ධාවන සටහන් විධිමත්ව පවත්වා ගෙන ගොස් නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී අදාළ දිනට පෙර ක්‍රමවත් පරිදි විගණනය වෙත යොමු කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ<br>------------------ | | | |
| (i) | 2016 දෙසැම්බර් 29 දිනැති 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාව සතු වාහන 06 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | අදාළ චක්‍රලේඛය ප්‍රකාරව ඉන්ධන දහනය පරීක්ෂා කළ යුතුවේ. | සභාව සතු වාහන වල ඉන්ධන දහනය 2020.07.10 වන දින සිට පරීක්ෂා කිරීමේ කටයුතු ආරම්භ කර ඇති බව දන්වා සිටිමි. |
| (ii) | 2009 අප්‍රේල් 16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 09/2009 හා 2009 ජුනි 07 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 09/2009(i) | 2019 වර්ෂයේ අගෝස්තු මස දක්වා ඇඟිලි සලකුණු යන්ත්‍ර මගින් පැමිණීම හා පිටවීම සනාථ කර නොතිබුණි. | අදාළ චක්‍රලේඛය ප්‍රකාරව ඇඟිලි සලකුණු යන්ත්‍රය මගින් පැමිණීම හා පිටවීම සනාථ කිරීමට කටයුතු කළ යුතුවේ. | 2019 අගෝස්තු මස සිට විධිමත් පරිදි පැමිණීම හා පිටවීම සටහන් කර නොතිබූ එක් අයෙකු වැඩ තහනම් කර ඇති අතර අනෙක් සේවකයින් දෙදෙනා පිළිබඳ පරීක්ෂා කර ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2006 නොවැම්බර් 14 දිනැති අංක PL/07/01/53 දරන පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛ<br>---------------------- | | | |
| | (i) අංක 09 | සුසාන භූමි ලේඛන නඩත්තු කිරීම, ප්‍රකාශයට පත්කිරීම හා තාප්ප වැටවල් යොදා ආරක්ෂා කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාළ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මේ වනවිට සභාව සතු සුසාන භූමි පවරා ගැනීමට සිදු කළ යුතු මූලික පියවර ගෙන ඇති බව ප්‍රකාශ කරමි. |
| | (ii) අංක 06 2.2(iii) | අඛණ්ඩව ක්‍රියාත්මක වන මාර්ග නඩත්තු ක්‍රමයක් අනුගමනය කර නොතිබුණු අතර සභාවට අයත් මාර්ග ගැසට් කර නොතිබුණි. | අදාළ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2021 වර්ෂයේ සිට සකස් කිරීමට පියවර ගන්නා බව දන්වා සිටිමි. |
| (ඉ) | උතුරු මැද පළාත් පළාත් පාලන කොමසාරිස්ගේ 2002 ජූලි 24 දිනැති පළාත් පාලන චක්‍රලේඛ අංක 20/2002 | වීථි රේඛා සහතික නිකුත් කිරීම සඳහා අයකරන පරීක්ෂණ ගාස්තුවෙන් සියයට 50 ක් ක්ෂේත්‍ර පරීක්ෂණ නිලධාරීන්ට ගෙවිය හැකි වුවද 2016 සිට 2019 වර්ෂය දක්වා කාලයේ අයකරගෙන තිබුණු රු.94,400 ක පරීක්ෂණ ගාස්තුව සම්පූර්ණයෙන් නිලධාරීන්ට ගෙවා තිබුණි. | අදාළ චක්‍රලේඛය ප්‍රකාරව ගෙවීම් සිදුකළ යුතුවේ. | 2016 සිට 2019 වර්ෂය දක්වා සම්පූර්ණ මුදලම නිලධාරීන් අතර බෙදාගෙන ඇති බැවින් එසේ බෙදාගෙන ඇති රු.94,400 ක මුදල අදාළ නිලධාරීන්ගෙන් අය කර ගැනීමට කටයුතු යොදා ඇත. |

2.1 මූල්‍ය ප්‍රතිඵල
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු 5,061,424 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු1,637,638 ක් විය.

## 2.2. ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම් ,බිල් කල ආදායම්,රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම් , රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් බදු | 2,150,000 | 1,723,500 | 1,576,307 | 1,090,836 | 1,546,000 | 1,394,480 | 1,093,965 | 943,643 |
| (ii) | කුලී | 5,662,000 | 8,408,465 | 7,279,341 | 3,286,650 | 7,092,700 | 5,101,135 | 4,801,135 | 2,157,526 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,262,750 | 1,652,445 | 1,632,445 | 20,000 | 536,550 | 826,475 | 826,475 | - |
| (iv) | වෙනත් ආදායම් | 4,841,850 | 4,001,000 | 3,367,341 | 3,775,738 | 5,139,100 | 3,560,232 | 1,951,429 | 3,142,079 |
| | | 13,916,600 | 15,785,410 | 13,855,434 | 8,173,224 | 14,314,350 | 10,882,322 | 8,673,004 | 6,243,248 |

### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.1,090,836 ක හිඟ හිටි වරිපනම් ශේෂය අයකර ගෙන නොතිබුණි. | හිඟහිටි වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | වරිපනම් බදු නොගෙවූ දේපළ හිමියන් වෙත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 158 වගන්තිය ප්‍රකාරව රතු නිවේදන නිකුත් කර තිබෙන බවත්, මෙම වර්ෂයේ ඉදිරි කාර්තුවල සිට ක්‍රමානුකූලව කටයුතු කිරීමට ක්‍රියාකරන බවත් දන්වමි. |

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගේ සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු. 1,289,438 ක් හා මුද්දර ගාස්තු රු. 2,486,300 ක් විය. | හිඟහිටි උසාවි දඩ හා මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මේ වනවිට සත්‍ය ශේෂය වන රු.1,496,254 ක මුදලක් නිදහස් කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර ඇති බව දන්වමි. |

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව වූ නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු නමුත් අදාල කාරණා සම්බන්ධව අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය ප්‍රකාරව අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී සකස් කිරීමට කටයුතු කරමි. |

(ආ) තිරසර සංවර්ධන

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත් වී නොතිබුණි. | එක්සත් ජාතීන්ගේ සංවිධානයේ 2030 තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයේ සිට තිරසර සංවර්ධන අභිමතාර්ථ සාර්ථක කර ගැනීමට අදාළ සැලසුම් සකස් කිරීමට සංවර්ධන විෂයය භාර නිලධාරියා දැනුවත් කිරීම් සිදු කර ඇත. |

(ඇ) අත්හැර දැමූ කර්තව්‍යයක්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුළදී කර්තව්‍යන් 04 ක් ආරම්භ කර ඒ සඳහා රු.592,185 ක් වැයකර තිබූ නමුත් 2019 දෙසැම්බර් 31 දින වනවිටත් අපේක්ෂිත ප්‍රතිඵල ලබානොගෙන අත්හැර දමා තිබුණි. | ගිවිසුම් ප්‍රකාරව කර්මාන්ත නිමකරවා ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි.<br>නියමිත දිනට වැඩ නිමකර නොමැති බැවින් කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම අනුව දීර්ඝ කිරීමට කටයුතු කළෙමි. |

(ඇ) කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අගෝස්තු මස සිට සැප්තැම්බර් මාසය දක්වා කාලපරිච්ඡේදයේ ගිවිසුම් අත්සන් කර තිබුණු ඇස්තමේන්තු පිරිවැය රු.3,647,842 ව්‍යාපෘති 09 ක 2019 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය සියයට 50 සිට සියයට 75 දක්වා විය. | ගිවිසුම් ප්‍රකාරව කර්මාන්ත නිමකරවා ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. නියමිත දිනට වැඩ නිමකර නොමැති බැවින් කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම අනුව දීර්ඝ කිරීමට කටයුතු කළෙමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.6,390,000 ක් වූ වාහනයකට අනතුරකින්ට සිදුවී තිබුණු රු.1,593,250 ක අලාභ හානි සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අදාළ අලාභය පිළිබඳව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

3.3 වත්කම් කළමනාකරණය

3.3.1 වත්කම් ලේඛනගත නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් පාලනය කරනු ලබන සුසාන භූමි 44 ක් ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුලත් කර නොතිබුණි. | සභාවට අයත් සියළුම වත්කම් ලේඛනගත කිරීමට කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂය සඳහා නව ගිණුම්කරණ ප්‍රමිතයන්ට අනුව තොරතුරු ඇතුලත් කර ඇති බව දන්වමි. |

3.3.2 පවරානොගත් වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඉඩම් 10 ක් හා සුසාන භූමි 45ක මිනුම් කටයුතු කර අයිතිය සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාව විසින් භාවිතා කරනු ලබන සියළු වත්කම්වල අයිතිය පවරාගෙන තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | සභාව සතු ඉඩම් හා සුසාන භූමි පවරා ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | සභාව විසින් පරිහරණය කරනු ලබන රු.68,709,729 වටිනා වාහන 09 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාව විසින් භාවිතා කරනු ලබන සියළු වත්කම්වල අයිතිය පවරාගෙන තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | මෙම වාහන සියල්ල මේ වර්ෂය තුළදී සභාව වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වමි. |

3.3.3 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.6,866,402 ක් වූ වත්කම් ඒකක 04 ක් භාවිතයට නොගැනීම හේතුවෙන් වර්ෂ ගණනවක් තිස්සේ නිශ්කාර්යව පැවතුණි. | සියළුම වත්කම් උපරිම කාර්යක්ෂම තාවයකින් යුතුව ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂයේදී සමීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

3.3.4 වාහන උපයෝජනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වාහන/ යන්ත්‍ර කුලී පදනම මත ලබාදීමෙන් 2019 දෙසැම්බර් 31 දිනට රු.2,159,775 ක හිඟ වාහනකුලී අයකර ගතයුතු පාර්ශවයන් හඳුනාගෙන නොතිබුණි. | අදාළ පාර්ශවයන් හඳුනාගෙන හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ගල්රෝලේ මීටර් පැය 370 කට අදාල ධාවන සටහන් අස්ථානගත කර තිබුණි. | ධාවන සටහන් භාර නිලධාරීන් විසින් පොත්පත් හා ලේඛන ආරක්ෂා කරගත යුතුවේ. | 2018.07.13 දින සිට 2019.07.22 දින දක්වා සටහන් කරන ලද ධාවන සටහන් හා 2019.07.23 දින සිට 2020.02.13 දක්වා සටහන් කරන ලද ධාවන සටහන් සමූපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම් වෙත විශේෂ විමර්ශන කටයුත්තක් සඳහා ලබාදී ඇති බව දන්වමි. |
| (ඇ) | මෝටර් ග්‍රේඩරය කුලියට ලබාදීමෙන් 2019 ජූලි 31 දිනට අයකරගත යුතු ශේෂය රු.453,175 ක් වූ අතර 2019 අගෝස්තු සිට දෙසැම්බර් දක්වා කුලියට ලබාදීම් සහ අයකරගත යුතු හිඟ ආදායම් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | හිඟ ආදායම් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කළ යුතුවේ. | අංක WPZA 5303 දරන මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයේ 2019 වර්ෂයේ අගෝස්තු මස සිට දෙසැම්බර් දක්වා වූ හිඟ ආදායම් පිළිබඳ විස්තර වාර්තාව විගණනයට පසුව ඉදිරිපත් කරමි. |

3.4 හඳුනාගත් පාඩු

----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.6,390,000 ක් වූ කැබ් රථයක් 2019 මැයි 16 දින අනතුරකට භාජනය වී රු.1,583,250 ක අලාභයක් සිදුවී තිබුණි. මෙම අනතුර සම්බන්ධ තොරතුරු සාවද්‍ය වීම සහ අවභාවිතය පදනම්ව රක්ෂණ වන්දි ප්‍රතික්ෂේප වී තිබුණු අතර වාහනය දේශීය නියෝජිතයාගේ ප්‍රාදේශිය අළුත්වැඩියා මධ්‍යස්ථානයක රඳවා තිබුණි. | මුදල් රෙගුලාසි 103, 104, සහ 105 ප්‍රකාරව කටයුතු කළ යුතු වන අතර අදාළ අලාභයන් අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | මේ වනවිට මෙම රිය අනතුර සම්බන්ධයෙන් පූර්ණ වගකීම එම අවස්ථාවේදී රියදුරු ලෙස කටයුතු කළ අයගේ අපරීක්ෂාකාරී රිය පැදවීම මත සිදු වී ඇති බවට අනාවරණය වී ඇති අතර එම අලාභය වූ රු.1,583,250 ක මුදල රියදුරු මහතාගෙන් අය කර ගැනීමට කටයුතු කරන ලෙස දැනුම් දී ඇත. |

3.5 දෘශ්‍ය අක්‍රමිකතා

-------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු වාහන කුලී පදනම මත යෙදවීමේ දී මුදල් අයකර ගැනීම සඳහා කාර්මික නිලධාරියාට ලබාදී තිබුණු ලදුපොත් 04 කින් අයකරගෙන තිබුණු මුදල් සභාවේ අරමුදලට බැරකර නොතිබුණි. | ලදුපත් මගින් අයකරනු ලබන මුදල් සියල්ල සභා අරමුදලට බැර කිරීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. දැනට භාවිතා කරන ලද ලදුපොත් සියල්ල ආරක්ෂිත සේප්පුවේ තැන්පත් කර ඇති බව දන්වා සිටිමි. |

04. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| උතුරු මැද පළාත් පාලන කොමසාරිස්ගේ 2015 මාර්තු 18 දිනැති අංක 04/2015 දරන චක්‍රලේඛයේ 06 ඡේදය ප්‍රකාරව සෘජුවම වගකියනු ලබන අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත්කර නොතිබුණි. | අදාළ චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත්කර වාර්තා ලබාගැනීමට කටයුතු කළ යුතුවේ. | අභ්‍යන්තර විගණන විමර්ශන නිලධාරියෙකු පත් කිරීම 2018 වර්ෂයේ රාජකාරි පැවරීම් ලේඛන පරීක්ෂා කිරීමේ සිදු වී ඇති බවට පෙනී ගියද එම නිලධාරිණිය විසින් ආදළ වාර්තා ඉදිරිපත් කිරීමක් හෝ විගණන සැලැස්මක් සකස් කිරීම සිදු කර නොතිබුණි. |

4.2 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2016 ජනවාරි 28 දිනැති අංක DMA/2009(1)(i)දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛයට අනුව 2019 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීමට කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයේ ඉදිරි කාර්තු සඳහා විගණන කළමනාකරණ කමිටු පැවැත්වීමට අවශ්‍ය කටයුතු සලසා ඇත. |